**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - 2021**

-----------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

----------------------------

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

-------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නමුත් භාවිතයේ පැවති පිරිවැය රු. මිලියන 68.3ක මෝටර් වාහන, පිරිවැය රු. මිලියන 248.1ක විද්‍යාගාර උපකරණ සහ රු. මිලියන 43.6ක් වූ කාර්යාල උපකරණ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ඵලදායි ජීවිත කාලය නැවත තක්සේරු කර ගිණුම්වලට ගෙන නොතිබුණි. | ඉදිරියේදී නැවත තක්සේරුවක් සිදුකර ගිණුම්ගත කිරීමට පියවර ගනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2009 වර්ෂයේ සිට සංවිධානයේ මූල්‍ය ප්‍රකාශනවල නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු ලෙස රු. මිලියන 6ක ශේෂයක් දක්වා තිබුණද, ඊට අනුරූපීව නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල එවැනි ශේෂයක් දක්වා නොතිබුණි. | ගිණුම් වලින් කපා හැරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. | කඩිනමින් ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ණය පදනම මත සේවා සැපයීම සංවිධානයේ ප්‍රතිපත්තිය නොවූවද, ණයට සේවාවන් සැපයීම නිසා සංවිධානයේ රු. මිලියන 38.4ක ණයගැති ශේෂ 2009 සිට 2021 දක්වා පැවතුණි. | මෙම ණය අයකර ගැනීමේ කටයුතු සිදුකරගෙන යමින් පවතී. | ණය අයකර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් යෙදිය යුතුය. |

**1.6.2 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කොන්ත්‍රාත්කරුවන් වෙත අත්තිකාරම් ලෙස ගෙවා තිබූ රු. මිලියන 10ක මුදල ප්‍රවර්තන වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. | අත්තිකාරම් පියවූ වහාම ගිණුම්වලට ගැනීමට කටයුතු කරනු ලැබේ. | කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා ඇති අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | වටිනාකම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ)ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි104 (1)(අ), 104 (3) සහ 104 (4) | 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වාහන අනතුරු 23 කට අදාල අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රු.මිලියන 3 | මු.රෙ. 104 පරීක්ෂණ කඩිනමින් අවසන් කර ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ආ)2003 ජූනි 02 දිනැති අංක PED 12 චක්‍රලේඛයේ 9.12 ඡේදය | සංවිධානය විසින් චක්‍රලේඛය ප්‍රකාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව සේවක රක්ෂණ ආවරණය කිරීම සඳහා වියදම සිදුකර තිබුණි. | රු. මිලියන 2.6 | මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවන පරිදි පාරිතෝෂිත මුදල් ගෙවීම වෙනුවෙන් තැන්පත් කර ඇති ස්ථාවර තැන්පතුවේ පොලියෙන් මෙම වියදම දරනු ලැබේ. | සුබසාධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේදී මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ)2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛය | තත්කාර්ය අතුරු අග්‍රිම ලබා ගත් නිලධාරීන් අවස්ථා 61 කදී ඒවා පියවීම සඳහා දින 34 සිට දින 102 ක් ප්‍රමාද කර තිබුණි. | රු. මිලියන 1.8 | ඉදිරියේදී වියදම් පියවීමේ ප්‍රමාදය අවමකර ගැනීමට පියවර ගනු ලැබේ. | ප්‍රමාදයකින් තොරව අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ)රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.1 වගන්තිය | දිස්ත්‍රික් කාර්යාල සඳහා කුලී පදනම මත වාහන ලබාගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කර නොතිබුණි. | රු. මිලියන 23 | වාහන සපයා ගැනීමට නොහැකි වූයේ නම් ආයතනයේ කටයුතු නිශ්චිතව අකර්මන්‍ය වීමට හේතුවන බැවින් පවතින තත්වයට මුහුණ දෙමින් වාහන සපයා ගැනීමට සිදුවීම මෙයට හේතුවී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 70,461,437ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 30,169,666 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.40,291,771 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ව්‍යාපෘති කළමනාකරණ අංශයේ අතිරික්තය රු.5,546,761 කින්ද, මානව ජනාවාස සැලසුම් සහ පර්යේෂණ අංශයේ අතිරික්තය රු.7,948,571

කින්ද, ගොඩනැගිලි පර්යේෂණ අංශයේ අතිරික්තය රු. 4,405,395කින්ද, භූ තාක්ෂණික සහ ඉංජිනේරු අංශයේ අතිරික්තය රු.6,379,365කින් ද, පරිසර අධ්‍යයන හා සේවා අංශයේ අතිරික්තය රු.9,644,943කින් ද නායායෑම් පර්යේෂණ සහ අවදානම් කළමනාකරණ අංශයේ අතිරික්තය රු.20,761,268 කින් ද වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංවිධානය සඳහා නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පිළියෙල කර තිබූ පනතේ කෙටුම්පත 2012 සැප්තැම්බර් 10 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබුණ ද එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා සැලසුම් කර ඇති බව වාර්තා කරමි | කඩිනමින් පනත සම්මත කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) මහනුවර දිස්ත්‍රික් කාර්යාලයක් පවත්වාගෙන යාමට වර්ග අඩි 1500-2000 ක ගොඩනැගිල්ලක් ප්‍රමාණවත් වුවද මාසිකව රු.125,000ක් කුලිය ගෙවා වසර 06ක් තිස්සේ වර්ග අඩි 6,017ක ගොඩනැගිල්ලක් ලබා ගෙන තිබුණි. | පසුගිය වසර තුල නායයෑම් ආපදා සිතියම් ගතකිරීමේ ව්‍යාපෘතිය(LHMP) සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ වෙනම කාර්යාලයක් පවත්වාගෙන යන ලදී.නමුත් මෙම වසරේදී එම ව්‍යාපෘති කාර්යාලයද දිස්ත්‍රික් කාර්යාලයටම අනුබද්ධ කිරීමට සැලසුම් කර ඇති අතර එය 2022 මැයි මාසයේ සිට ක්‍රියාත්මක වේ. | අවශ්‍යතාවයට ප්‍රමාණවත් ගොඩනැගිලි කුලියට ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට නායයෑම් සමීක්ෂණය සඳහා ඉල්ලුම්පත් 11,972ක් ලැබී තිබූ නමුත් ඉල්ලුම්පත් 4,770 ක් නොහොත් ලැබී තිබූ ඉල්ලුම්පත් වලින් සියයට 39.84කට අදාළ සමීක්ෂණ සිදු කර නිර්දේශ ලබා දී නොතිබුණි. | 2021 වර්ෂයේ ලැබුණු ඉල්ලීම් 11,972 ක් අතරින් ප්‍රමුඛතාවය අනුව 7,202 ක් අදාල වාර්තා නිකුත් කිරීමට කටයුතු කර ඇති අතර, අනිකුත් ඉල්ලීම් අතුරින් අනිවාර්යයෙන්ම සිදුකල යුතු පරීක්ෂණ වාර්තා මේ වන විට නිකුත් කිරීමට කටයුතු කර ඇත. | නායයෑම් සමීක්ෂණ ඉල්ලුම්පත් සඳහා ක්ෂේත්‍ර පරීක්ෂා සිදුකර කඩිනමින් නිර්දේශ ලබාදීමට කටයුතු කළ යුතුය. |

**3.3 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ප්‍රජා මූලික ආපදා අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සහ නායයෑම් විස්තාපනය හඳුනාගැනීමේ පද්ධති වෙනුවෙන් 2015 දී ලැබී තිබුණු රු. මිලියන 7.6ක් සහ නාය යෑම් අවදානම් අවම කිරීමේ අංශය වෙත 2015 වර්ෂයේදී ලැබී තිබුණු රු. මිලියන 5ක 2021 දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජනය කර නොතිබුණි. | මෙම මුදල් උපයෝජනය කිරීම සඳහා අදාල ව්‍යාපෘති 2022 ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇති අතර ඒ පිළිබඳ ඉදිරි වැඩකටයුතු කෙරෙමින් පවතී. | ප්‍රතිපාදනයන් අදාල අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරිමට පියවර ගත යුතුය. |
| (ආ) නායයෑම් අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 150 කි. රු. මිලියන 101.35ක් ඌන උපයෝජිතව පැවතුණි. | රටේ පැවති කොවිඩ් 19(Covid 19) වසංගත තත්වය නිසා කොන්ත්‍රාත් ප්‍රධානය කිරීමේ ප්‍රමාදයක් සිදුවිය. තවද අදාල කොන්ත්‍රාත්තුව සිදුකරගෙන යාමේදී මලපට්ටාව වැඩබිමෙහි උද්ගතවූ ප්‍රායෝගික දුෂ්කරතා හා රටෙහි පැවති අමුද්‍රව්‍ය ඌනතාවයන් ව්‍යාපෘතියේ ප්‍රගතිය අඩුවීමට හේතු විය. | ප්‍රතිපාදන ලබාදුන් කාර්යයන් ඒ අයුරින් ඉටුකිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) රත්නපුර සහ කළුතර දිස්ත්‍රික්කවල විද්‍යාගාර පහසුකම් සහිත කාර්යාල ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ සංවිධානය වෙත ලැබී තිබූ රු. මිලියන 60ක මූලධ්‍ය ප්‍රතිපාදන වලින් රු. මිලියන 35.37ක් උපයෝජනය කිරීමකින් තොරව පැවතුණි. | කළුතර දිස්ත්‍රික් ලේකම් විසින් වෙන් කරනු ලැබූ භූමිය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත පැවරීමේ කටයුතු සම්පූර්ණ නොවීම හේතුවෙන් කළුතර දිස්ත්‍රික්කයේ විද්‍යාගාර ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී ඇත. | ප්‍රතිපාදන ලබාදුන් කාර්යයන් සැලසුම් කළ අයුරින් ඉටුකිරීමට පියවර ගත යුතුය. |
| (ඈ)ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ තාක්ෂණික දායකත්වයෙන් අධි අවදානම් කලාපවල ජීවත්වන පුද්ගලයන් සුරක්ෂිත ස්ථානවල පදිංචි කිරීමේ වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 14ක පවුල් 1000 ක් සඳහා ලැබී තිබූ ප්‍රතිපාදන රු.මිලියන 32.85 ක් උපයෝජන කර නොතිබුණි. | වර්තමානයේ ගොඩනැගිලි ද්‍රව්‍ය මිල ගණන් සහ ශ්‍රම වියදම් ඉහලයාම සැලකිල්ලට ගනිමින් පවතින වෙළෙඳපොල මිල ගණන් යටතේ නිවාස ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම වෙනුවෙන් නව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කොට ඇත. ඒ අනුව, ඉහත අනුමැතිය ලැබීමෙන් පසුව 2022 වසරේදී නිවාස ඒකක 35 ක් ඉදිකිරීමට සැලසුම් කොට තිබේ. | ප්‍රතිපාදන ලබාදුන් කාර්යයන් සැලසුම් කළ අයුරින් ඉටුකිරීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ)නායයෑම් පැතිකඩ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු ප්‍රතිපාදන වලින් රු.මිලියන 34.42 ක් උපයෝජනයකින් තොරව පැවතුණි. | රටතුල පැවැති කොවිඩ් වසංගත තත්වය මත, මෙම ක්‍රමවේදයේ නිරවද්‍යතාවය, ක්ෂේත්‍ර පරික්ෂා කර තහවුරු කරගැනීමට නොහැකි විය. | ප්‍රතිපාදන භාවිතා කරමින් අදාළ කාර්යය සැලසුම් කළ අයුරින් ඉටුකිරීමට පියවර ගත යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංවිධානයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 21ක පුරප්පාඩු පැවතුණි. මේ අතර අධ්‍යක්ෂ (පාලන) තනතුර 2016 වර්ෂයේ සිටද, අධ්‍යක්ෂ (නායයෑම් පර්යේෂණ හා අවධානම් කළමනාකරණ) තනතුර 2018 වර්ෂයේ සිටද පුරප්පාඩුව පැවතුණි. තවද, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03ක් වන ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ, විද්‍යාඥ, කළමනාකරු (තාක්ෂණික / රසායනාගාර) යන තනතුරුවලද පුරප්පාඩු සංඛ්‍යාව 19ක් වූ අතර එය වසර 03ක කාලයක සිට පැවතුණි. | ඉදිරියේදී බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | බඳවාගැනීමේ පටිපාටියේ දක්වා ඇති සුදුසුකම් පරිදි සේවකයන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |